ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය
இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் உயர் ஸ்தானிகராலயம்
High Commission of the Democratic Socialist Republic of Sri Lanka in Malaysia

# දැන්වීමයි!

**විදේශ රැකියා සඳහා නීත්‍යානුකූලව විදේශ ගතවූ ශ්‍රී ලාංකිකයින්ගේ දරුවන් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඔවුන් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල/ විද්‍යායතන/පාසල් වලට ඇතුලත් කිරීමට අපේක්ෂා කරන විගමනික ශ්‍රමිකයන්ගේ තොරතුරු රැස්කිරීම.**

රැකියා සඳහා නීත්‍යානුකූලව විදේශ ගතවූ ශ්‍රී ලාංකිකයින් සිය දරුවන් සමඟ නැවත පදිංචිය සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී එම දරුවන්ට රජයේ විශ්ව විද්‍යාල, විද්‍යායතන හා **පාසල්** වල අධ්‍යාපනය හැදැරීමට අවශ්‍ය පහසුකම් සැලසීම පිළිබඳව විදේශ රැකියා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව කටයුතු කරගෙන යාමට අපේක්ෂා කර ඇත.

ඒ අනුව, ඉදිරි කාල පරිච්ඡේදය තුළ ඔබ ඔබගේ දරුවන් සමඟ ශ්‍රී ලංකාවට නැවත පදිංචියට යාමටත්, ඔබගේ දරුවන් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල/විද්‍යායතන/**පාසල්** වල අධ්‍යාපන හැදැරීමටත් අදහස් කරන්නේ නම්, පහත සඳහන් තොරතුරු **2019** නොවැම්බර් **22** වන දිනට පෙර අප වෙත දැනුම් දෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු.

- මවගේ හෝ පියාගේ නම :
- ගමන් බලපත් අංකය :
- මෙරට දුරකථන අංකය :
- ඔබ ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචිවීමට අදහස් කරන දිස්ත්‍රික්කය :
- ඔබේ දරුවා / දරුවන් ඇතුළත් වීමට අපේක්ෂා කරන විෂය ධාරාව :

ඉහත සඳහන් තොරතුරු පහත ආකාරයෙන් මෙම කාර්යාලයට දැනුම් දිය හැකිය.

- විද්‍යුත් තැපැල :slhc.kl@mfa.gov.lk /labour.slhcmalaysia@gmail.com
- ෆැක්ස් අංකය :603-20341707
- දුරකථන අංකය :603-20341705/0192897540/0192897564

(කරුණාකර මෙම තොරතුරු අනෙකුත් ශ්‍රී ලාංකිකයන්ගේ දැනගැනීම සඳහා යොමුකරන්න)

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
මැලේසියාව

HIGH COMMISSION OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA